# 33

## පසු කතාව

දැන් බිමල් "සඳුරවි" පුවත් පතෙහි පුවත් පත් කලා වේදියෙකු ලෙසින් කටයුතු කරයි. එය ජන දින පුවත් පත හා හරි හරියට තරග කරන පුවත් පතයි. විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට තරම් ලකුණු මදි වූ බැවින් බිමල් විභාගයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් සමත් වීමෙන් පසුවය "සඳුරවි" පත්‍රයට බැඳුණේ.

මානව අයිතිවාසිකම් පිළිබඳව ඔහු ලියූ ලිපි පෙළ බොහෝ ජනප්‍රිය විය. දැන් ඔහු වඩාත් නැඹුරුව අද්භූත විෂයයන්ටය. මෑතදී ඔහු පිට සක්වල ජීවීන් හා පෘථිවිය අතර සම්බන්ධතා ගැන සොයාගත් තොරතුරු වලින් ලිපි පෙළක් ආරම්භ කළේය.

උපසේන පෙරළා ගෙදර ආවාට පසු සුසානටද බොහෝ සුවයක් දැනුණි. උපසේන දැන් ජනදින පුවත් පතේ කටයුතු නොකරයි. ඇත්තෙන්ම උපසේන විශ්‍රාමික සුවයෙන් කල් ගෙවන්නේ. ඒ අතරේ ඔහු අපූරු පොතක් ලියාගෙන යයි. එය "ටෝමිල්" ලා ගැන නවකතාවකි. ජීවත් වෙන මිනිසුන් පුහාත්මයට ගෙන යම් යම් ආකාරයෙන් මනස වෙනස් කොට අධි නිද්‍රා තත්වයකට පත් කර ඔවුන් වැඩට යොදවන ආකාරයයි ඔහුගේ නවකතාවේ තේමාව.

එදා පුරසඳ රාත්‍රියේ ගන්දර කළු පුවෙන් පිටව ආ පසු උපසේනට ඒ සියල්ලම නැඟෙන සිහිනයක් පරිද්දෙනි. එහිදී සිදුවූ ඇතැම් දෙය යම් සිහිනෙක ගල් ගැසියන් බුවර උපු සිහිනෙන් අමතක විය.

ගන්දර කළු පුව පිළිබඳ කිසිදු තොරතුරක් පුවත් පතක හෝ පළ නොවූයේ එය රහස්‍ය පුද්ගලික වූ අඩවියක් බැවිනි. තවද ධනවත් බලවත් අය පිළිබඳ ඇතැම් තොරතුරක් මීදුමේ යට ගියාවක සැඟවී යයි. ඒ මීදුම තුළින් සාමාන්‍ය පුද්ගලයෙකුට යා හැකි නොවේ.

කාලිංග දිය වඩන තමාට සොයා එව් යැයි ද බිමල් සිතුවද එවැන්නක් සිදු නොවීය. තමාත් උපසේනත් කාලිංගගේ තවත් එක් දඩයමක ඉඳ ඉන්නන් පමණක්

වන්නට ඇතැයි වරෙක බිමල් අනුමාන කලේය.
ගෙදරදී පවා, උපසේන හෝ බිමල් ඒ සිදුවීම
ගැන කතා නොකලේය. දෙදෙනාම කරදරයකින් තොරව
ගෙදර ඇවිත්තිම පමණි ඔවුනාට අවශ්‍ය වූයේ.

සැබවින්ම සිදුවූ දේ අත්වින්දෝ බිමල් හා සුලෝචනාව
පමණි. මන්ද? උපසේනද යම්කිසි අයුරක, තත්වයක
සිටි බැවිනි. දැන් නම් උපසේනගේ චින්තනය, ක්‍රියා කලාපය
සාමාන්‍ය තත්වයක තිබේ. ඔහු, විශ්‍රාම ගත් පුවත් පත්
කලාවේදියෙකු බවය ඔහු අසන්නෙකුට පවසන්නේ. තමා
අලුත්ම නවකතාවක් ලියන බවද ඔහු වැඩිදුරටත් පවසයි.

සුලෝචනාත්, බිමලුත් දැන් වඩාත් මිතුරුය.
'කලපුවෙන් පිටව බෝට්ටුවෙන් ආ ගමන ත්‍රාසයෙන් පිරි
සිදුවීමක් ලෙසය සුලෝචනා සිහිපත් කරන්නේ.

චිදු විජයදාස බෝට්ටුව, වාද්දුවේ වෙරළට
ගෙන එන විටත්, අරවින්ද නම් ත්‍රිරෝද රථය එතැනට
ගෙනවිත් තිබිණි. උපසේනත්, බිමලුත්, සුලෝචනාත්
එතැනින් ඒ රාත්‍රියේම ගියේ තිරංවලාගේ ගෙදරටයි.
ඔවුන් රාත්‍රිය ගත කළේ එහිය. තිරංවලා පවා බොහෝ
තොරතුරු දැනගත්තේ පසුවය. පොලීසියට කීමක්
අනවශ්‍ය බව තිරංවලාද කීවාය.

එයට පසුවද තිරංවලා පිලියෙල කරදුන්
කුලී රියකින් තිදෙනා නුගේගොඩට ආහ. ජීවිතය යළිත්
කෙමෙන් යථා තත්වයට පත්වුනේ එතැන් පටන්ය.

පද්මා අක්කාද පෙර පරිදි ඇම දෙනාටම
උදව් උපකාර කරමින් කල් ගෙවුවාය.

දිනක්, "තිරංවලා අක්කාව ගිහින් බලලා
එමු" යි පද්මා බිමල්ටත්, සුලෝචනාටත් යෝජනාවක්
කලාය.

එක් සෙනසුරාදාවක තිදෙනා දුම්රියේ නැගී
කලුතර ගියහ.

එදා හොඳින් අව්ව ඇති දිනයකි. තිරංවලාත්
එඩ්නාත් රසට බත් වේලක් උයා තිබිණි. දිවා ආහාරයෙන්
පසු පද්මාත්, තිරංවලාත් අලසව හිඳ ගෙන සතුටු සාමීචි
දොඩද්දී සුලෝචනාත් සමඟ බිමල් මිදුලට බැස්සේය.

"ගන්දර කලපුව පැත්තෙ ගිහිං බලමුද? නිකමට?" බිමල් ඇසුවේය.

"මං කැමතියි" සුලෝචනා කීවාය. "ගන්දර කලපුව විතරක් නෙවි. ගිල්ඩා දූනුවිලගෙ ගෙවල් පැත්තෙ ගිහිල්ලා බලන්නත් මට ආසයි"

"ඉස්සරවෙලා ගන්දර බලලා එමු" බිමල් යෝජනා කළේය.

දෙදෙනා බස් රියක නැගී රුප්පාව පාර දාගෙන බැස ගී පවු පාර දිගේ කලපුව අතට ඇවිද යන්නට වූහ. අවට පාලු විය. ඈත කිරලෙ කැලේ මූසල හඬක් පමණි ඇසුණේ.

"සේරම මැරුණාද?" සුලෝචනා රහසින් මෙන් කීවාය.

"ගිහිං බලමු"

ගේට්ටුවට ලං වෙද්දී සුලෝචනා නොසිතාම බිමල්ගේ අත අල්ලා ගත්තාය. ගේට්ටුව උඩින් පැන්නා ඈ ඒ අත අතහැරියේ නැත

ගේට්ටුවේ ගරාදි අතරින් ගස්වැල් සේම ගොඩනැගිල්ලේ කොටසක්ද පෙනුණි. කිසිදු හානියක් වූ බවක ලකුණක්වත් නොවීය.

දෙතුන් දෙනෙක් වත්තේ වැඩ කරනු පෙනුණි. ගේට්ටුව ළඟටම ගියද බිමල් ගරාදියට අත නොතැබුවේය.

"ඕකෙ විදුලිය ඇති," ඔහු අනතුරු ඇඟවීමක් කළේය.

වත්තේ වැඩ කළ තිදෙනා ඈත මූලගෙයි තිබ්බේකින් ඉඳ බොමින්ය.

බිමල් මෝහනයකින් මෙන් බලා සිටියේය.

තව මඳ වේලාවකින් රෝද පුටුවක් තල්ලු කරගෙන තරුණ කාන්තාවක් ගේට්ටුව දෙසට ආවාය. ඒ පංචමා බව බිමල් හඳුනාගත්තේ ඇගේ නිල ඇඳුමෙනි.

"මොනවද ඕනෑ?" ඈ ඇසුවාය.

පිළිතුරක් දෙන්නට පෙර බිමල්ට පෙනුණේ රෝද පුටුවේ හිඳ සිටි මිනිසාය. ඔහුගේ දෑස වසා කළු උපැස් යුවලකි. දෙකකුල් වසා සුදු පොරෝනාවකි.

දෙදර මසක් ස්ලීපිං ගවුමකි. උඩුස් යුවල සහිත මුහුණ පලින් ගල පිලිස්සී ගොසිනි. ~~ඡ~~ ඡවි නිද්බ හාන්සමක ලකුණු දෙකමට්ටු ලෙස විය.

"ඩිගොල්ලො කවුද?" පංචිමා ඇසුවාය.

"අපි- අපි කම්බැද්ද කැම්පස් එකේ ස්ටුඩන්ට්ස්ලා" සුලෝචනා කීවාය.

"අපි කලපුවේ ගැලප් ගැන සොයන්න ආවා" බිමල් කියද්දී,

"කලපුවේ ගැලප් නැ-නැ" යි මිනිසා රළු හඬින් කීවේය.

"හරි- හරි කලපුව අවට වුනේ ගැලප්" බිමල් හරි ගැස්සුවේය.

"මේක පුයිවෙට් ප්‍රොපටි තේරුණාතෙ?" පංචිමා කීවාය. "කරුණා කරල යන්න. නැත්තං අපි පොලිසියට කියනවා"

"අපි යනවා" සුලෝචනා යන්නට හැරෙද්දී,

"කවුද මෙහෙ ඉන්නෙ?" යි බිමල් ඇසුවේය.

"දැන ගන්න ඕනැද?" පංචිමා කීවාය. "මේක පුද්ගලික නිවසක්. නමක් දෙන්න බැ. ඉතිං යන්න"

බිමල් හා සුලෝචනා ආපසු හැරෙන විටම, රෝද පුටුවෙහි හිඳ සිටි මිනිසා,

"ඇහැලෙ ගම" කීවේය. "ඇහැලෙගම- සමන් බටසාර ඇහැලෙගම."

පංචිමා රෝද පුටුව හරවාගෙන ඇතුළට යද්දී ඔහු "උපසේන- උපතේ- දෝසෙ- විජේසෝ- කොරාවිරෝ" ආදී නම් වලක් කියවාගෙන ගියේය "ලෙක්ස්- පංචිමා- ගිල්බා---"

රෝද පුටුව මන්දිරය ඇතුළට යද්දී සුලෝචනාගේ බිමලුත් හාර ඇතුළට ඇවිද ආවේ කුමක් සිතා ගන්නට බැයි නොහැකිව එක්තරා කම්පනායකිනි.

"කාලිංග- තේද?" සුලෝචනා බොහෝ දුරට ආ පසු කීවාය.

"අහන්න ත් ඕනැද- සුලෝචනා නංගි? ඒ වගේ මිනිස්සුන්ට මරන්න බැ. එක එක වෙස් මවා ගෙන එනවා- ඩ්‍රැකියුලා වගේ." බිමල් කීවේය.

"බිමල් අයියා. මේ ගමන්ම අපි යමුද ගල්බඩා දිනුවිල බලලා, එන්න? මී? මොකක් හරි උත්තරයක් ඇතිනෙ එතන?"

"නංගි කියනව නම්. යමු බලන්න."

දෙදෙනා යළිත් බස්රියක නැගී කළුතර ධර්මෝදය හන්දිය වෙත අවුත් එතැනින් ත්‍රිරෝද රියක නැගී ඩයස් මාවත බලා ගියෝය.

112 නොම්මරය සහිත ගේට්ටුව වසා දමා තිබිණි. කාර්යාල ඉහළින් උඩු මහලේ කොටසක් යන්තමට පෙනුණද සියලු දොර කවුළු වැසිලාය.

හිත දිරිගෙන බිමල් සීනුව නාද කළේය. මදක් බලා සිට යළිත් නාද කළේය.

හෙමින් සීරුවේ ගේට්ටුවේ කුඩා දොරටුව මදක් විවර විය. වියපත් මිනිසෙකුගේ මුහුණ එතැන මතු විය.

" මොනවද ඕනෑ?" ඔහු වෙවුලන ස්වරයෙන් ඇසුවේය.

"ගල්බඩා නෝනා? ගල්බඩා දිනුවිල?" බිමල් ඇසුවේය.

"මෙහේ නැහැ"

"පියානෝ පන්ති තියෙනවා නේද?"

"නැහැ."

"අපි ආවෙ පියානෝ පන්තිය ගැන අහන්න"

සුලෝචනා කට දැම්මාය.

"මෙහේ පන්ති නැහැ." මදක් නොරුස්නා හඬින් කී මිනිසා "මෙහේ කවුරුවත්ම නැහැ" යි තදින් කීවේය.

" ඒ නෝනට මොකද උනේ?"

"මන්ද. මං මෙතන මුර වැඩේ විතරයි."

බිමල් තම සාක්කුවෙන් රුපියල් සියයක් ගෙන අතෙහි තැබුවේය. බල්ලාට - මස් කටුවක් මෙනි. මහල්ලාගේ ඇස් විවර විය. කට ඇරුණි. දිව ඇදුණි.

"ඒ නෝනා කොහේද?"

"නෝනා රට ගියා. මේ ගේම විකුණුවා"

බිමල් සීයේ කොළයෙන් පවන් ගසා ගත්තේය.

"කවුද වෙන ගන්නෙ?"

"මන්දා"

"නමක් දන්නෙ නැද්ද?"

"දැන්නමයි මාත්තයා. නමක් දන්නවනං කියනවා නොවැ. කවුද සල්ලි කාරයෙක්."

බිමල් සීයේ නෝට්ටුව සාක්කුවේ ලා ගෙන සාක්කුවෙන් ගත් පන්සේ කොළයක් මනුස්සයාට දිග කළේය.

ඔහු එය ඔබා ගන්නා අතරේ. "දන්න මහල නමයි කිව්වෙ!" කියා දොරටුව වසා දැම්මේය.

සුලෝචනා හඬා හඬා ගා සිනාසෙන්නට වූවාය. දෙදෙනා පාර දිගේ ඇවිද ආහ.

"අනේ අයියා! ඔයාටත් පිස්සු!" ඇය දැස් දල්වා කීවාය.

"පිස්සු වැටෙන්නෙ නැද්ද? මේ ලෝකෙ? පිස්සෙක ගොඩක් මැද්දෙ ඉන්න කොට" බිමල් කීවේය. "දන්නවද නංගි? මේ ලෝකෙ ජේරම - ජේරම සල්ලි වලට යටයි."

"ඒ උනාට නැහැ අයියා. සමහර වෙලාවට සීයක් දුන්නත් පන්සීයක් දුන්නත් ලැබෙන උත්තරේ එකයි."

"ඒක හරි නංගි. ඔයාගෙ දර්ශනයට මං කැමතියි" කී බිමල් සුලෝචනාගේ අත අල්ලා ගත්තේය. කිරිවෙල්ලාගේ නිවෙසට එන බස් එකට නගින තෙක් ඔහු ඒ අත අතහැරියේ නැත.

ඔවුන් එනතෙක් කිරිවෙල්ලා අත්තාත්, පද්මා අත්තාත් බලා සිටියේ හැලපයක් හා උඳු උඳුවේ තේ එකක් බී කැරම් අතක් සෙල්ලම් කරන්නටයි.

සාදුපි මහින්ද පයන්ලක ලියූ "ගන්දර කාලපුව" මෙතෙකින් නිමාවෙයි.

දෙසැම්බර් 26. 2012 බදාදා. 3.30 p.m.